සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 22 S I

නම: .............................................. | භූගෝල විද්‍යාව - I | කාලය පැය එකයි

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. පෘථිවි ගෝලය මත නිරන්තර ක්‍රියාකාරිත්වයෙන් යුතු ශාක හා සත්ව විශේෂ ඇතුළත් සමස්ත ජීවී පරිසරය ........................................ ලෙස හඳුන්වයි.
(ජලගෝලය/ ශිලා ගෝලය/ ජෛව ගෝලය)

02. නිර්මාණය වී ඇති ආකාරය අනුව වර්ගකල විට හිමාලය, ඇල්ප් වැනි කඳු අයත් වන්නේ .............................. ගණයටය.
(ශේෂකඳු / නැමි කඳු/ කුට්ටි කඳු)

03. ලෝකයේ විශාලතම මිරිදිය විල ලෙස සැලකෙන්නේ .................................... විලයි.
(සුපීරියර්/ බයිකල්/ ටිටිකාකා)

04. සාම්ප්‍රදායික නොවන සුළු අපනයන බෝගයක් වූ කජු වගාව .................................... දිස්ත්‍රික්කය තුල වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත.
(මන්නාරම/ මාතලේ/ කළුතර)

05. ශ්‍රී ලංකාවේ 2001 වසරේදී ආරම්භ කරන ලද මයික්‍රො මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය ........................................ ප්‍රදේශයේ පිහිටුවා ඇත.
(වීරවිල/ පොල්ගහවෙල/ බටඅත)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටාද වැරදිනම් 'වැ' යන්න වටාද රවුමක් අඳින්න.

06. සාගර ජල තලයෙන් ඉහළට නැගුණු විශාල භූමි ස්කන්ධ මහද්වීප නම් වේ. (නි/වැ)

07. පතන ශීඝ්‍රතාව ක්‍රියාත්මක වන්නේ අපරවර්ති ගෝලයේ පහළ සීමාවේදීය. (නි/වැ)

08. ලෝකයේ වානේ නිෂ්පාදනය හා අපනයනය සඳහා ප්‍රමුඛත්වය ගෙන ඇති රට චිනයයි. (නි/වැ)

09. ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක වී වගාව සිදු කරනු ලබන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ය. (නි/වැ)

10. රට අභ්‍යන්තරයේ වැව්, ගංගා, පොකුණු ආශ්‍රිතව කෙරෙන ධීවර කර්මාන්තය කරදිය ධීවර කර්මාන්තයට අයත් වේ. (නි/වැ)

- ප්‍රශ්න අංක 11 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය තිත් ඉරි මත ලියා දක්වන්න.

11.

| 'අ' කඳුවැටිය | 'ආ' පිහිටි මහද්වීපය |
|---|---|
| 1. ඇට්ලස් | A. ඕස්ට්‍රේලියාව |
| 2. ඇල්ප් | B. ආසියාව |
| 3. අල්තායි | C. යුරෝපය |
| | D. අප්‍රිකාව |

1. CBA  2. CDB  3. DCB  4. ACD  (..........)

12. 'අ' ආරම්භක ස්ථානය

1. ග්ලැසියර් දිය වූ ජලයෙන්
2. විලකින්
3. උල්පතකින්

'ආ' ගංගාව

A. නයිල්
B. රයින්
C. තේම්ස්
D. මහවැලි

1. BAC    2. BCA    3. CAB    4. DCA    (...........)

13. 'අ' මහද්වීපික තටකය

1. අප්‍රිකා මහාද්වීපික තටකය
2. ආසියා මහාද්වීපික තටකය
3. ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය

'ආ' පිහිටි දූපත

A. පැසුවා නිව්ගිනියාව
B. සයිප්‍රස්
C. සුමාත්‍රා
D. මැඩගස්කරය

1. ACD    2. DAC    3. BDC    4. DCA    (...........)

14. 'අ' කර්මාන්තය

1. මිනිරත්
2. පිගන්මැටි
3. වේවැල් භාණ්ඩ

'ආ' ව්‍යාප්ත වී ඇති ප්‍රදේශය

A. මීටියාගොඩ
B. රදාවඩුන්න
C. පුල්මුඩේ
D. බෝගල

1. ACD    2. DCB    3. DAB    4. ADB    (...........)

15. 'අ' භෝගය

1. වී
2. පොල්
3. සුළු අපනයන භෝග

'ආ' පර්යේෂණ ආයතනය පිහිටි ස්ථානය

A. ලුණුවිල
B. අගුණකොළපැලැස්ස
C. බෝඹුවල
D. මාතලේ

1. ACB    2. BAD    3. CAB    4. CAD    (...........)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

16. මහාද්වීප මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය ...................................... ලෙස හැඳින්වේ.


17. තුන්ද්‍රා දේශගුණය දක්නට ලැබෙන්නේ ........................................ කලාපය තුළයි.

18. කඳුවැටි ගණනාවක් විශාල ප්‍රදේශයක පැතිරී ගිය විට එය ........................................ ලෙස හැඳින්වේ.

19. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්තශාලාව කැළණියට ආසන්න ........................................ ප්‍රදේශයේ පිහිටා ඇත.

20. ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම් නිර්මාණය කිරීම සඳහා .................................... ප්‍රක්ෂේපනය පදනම් කරගෙන ඇත.

• ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවල පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ප්‍රස්තාරය ප්‍රයෝජනයට ගන්න.




21. ප්‍රස්තාර සටහනට අනුව 2016 වර්ෂයේදී සාක්ෂරතාවය වැඩිම රට ............................................................ වේ.

22. 2016 වර්ෂයේදී අඩුම සාක්ෂරතාවයන් පෙන්නුම් කරන රට ............................................................ වේ.

23. 2017 වර්ෂයේදී උපතේදී ආයු අපේක්ෂාව ඉහළම රටක් ලෙස ............................................................ හඳුනාගත හැකිය.

24. උපතේදී ආයු අපේක්ෂාව අඩුම රට ............................................................ වේ.

25. සාක්ෂරතාවය සහ උපතේදී ආයු අපේක්ෂාව සමාන මට්ටමක පවතින රට ............................................................ වේ.

- **ප්‍රශ්න අංක 26 සිට 36 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

26. පහත සඳහන් භූ තැටි අතරින් සාගරික තැටියක් වන්නේ කුමක්ද?
    1. අප්‍රිකානු තැටිය
    2. පැසිපික් තැටිය
    3. යුරේෂියානු තැටිය
    4. ඇන්ටාර්ක්ටික් තැටිය
    (..................)

27. • දියළු පස • 27C° පමණ උෂ්ණත්වය • 2000mm පමණ වර්ෂාපතනය • තැනිතලා ප්‍රදේශ
    ඉහත සඳහන් භෞතික සාධක අවශ්‍ය වන්නේ පහත සඳහන් කුමන භෝගයටද?
    1. වී 2. තිරිඟු 3. රබර් 4. පොල් (..................)

28. උත්තනාංශය සමඟ උෂ්ණත්වය අඩුවීම, ජල වාෂ්ප, වලාකුළු දූවිලි අංශු නොමැති, විද්‍යුත් ක්‍රියාවලීන් බහුලව සිදුවන වායුගෝලීය ස්තරය වන්නේ,
    1. පරිවර්තී ගෝලය
    2. අපරවර්තී ගෝලය
    3. මෙසෝ ගෝලය
    4. තාප ගෝලය
    (..................)

29. මැන්චූරියානු තැන්න හා නල්ලබාර් තැන්න අයත් වන මහද්වීප දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. ආසියාව හා ඕස්ට්‍රේලියාව
    2. ඕස්ට්‍රේලියාව හා යුරෝපය
    3. අප්‍රිකාව හා යුරෝපය
    4. ආසියාව හා අප්‍රිකාව
    (..................)

30. ගිනිකඳු ක්‍රියාකාරිත්වය නිසා අත්ලාන්තික් සාගරයේ නිර්මාණය වී ඇති දූපතකි.
    1. හවායි 2. අයිස්ලන්තය 3. ජපන් 4. තස්මේනියාව (..................)

31. රතු මුහුද සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වට වී ඇත.
2. සාගරයට සම්බන්ධ සාගරයේම පිහිටි මුහුදකි.
3. මධ්‍යධරණී මුහුදේ කොටසක් ලෙස පිහිටා ඇත.
4. අර්ධ වශයෙන් ගොඩබිම්වලින් වට වූ මුහුදකි. (..................)

32. ශ්‍රී ලංකාවේ සහල් අතිරික්තයක් නිෂ්පාදනය කරන වියළි කලාපයට අයත් දිස්ත්‍රික්ක දෙකක් වන්නේ,
1. අම්පාර, මොණරාගල
2. මාතලේ, අනුරාධපුර
3. පොළොන්නරුව, අම්පාර
4. කුරුණෑගල, පොළොන්නරුව (..................)

33. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු අපනයනය කරන රටවල් දෙකක් දැක්වෙන පිළිතුර කුමක්ද?
1. මාලදිවයින හා සුමාත්‍රා දූපත්
2. ඉන්දියාව හා පාකිස්ථානය
3. දකුණු කොරියාව හා මලයාසියාව
4. ඉන්දියාව හා සිංගප්පූරුව (..................)

34. නිෂ්පාදන දායකත්වය හා අයිතිය බහු ජාතික සමාගම් සතුවීම හා නිෂ්පාදන සඳහා වැය කරන මුදල මෙන් දෙගුණයක් කර්මාන්තයට අදාල පර්යේෂණ සඳහා වැය කරන කර්මාන්තය වන්නේ,
1. මෝටර් රථ කර්මාන්තය
2. යකඩ හා වානේ කර්මාන්තය
3. විද්‍යුත් කර්මාන්තය
4. පෙට්‍රෝ රසායන කර්මාන්තය (..................)

35. තේමා සිතියමක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරින් කුමක්ද?
1. ශ්‍රී ලංකාවේ මාර්ග සිතියම
2. භූ ලක්ෂණ සිතියම
3. අප්‍රිකාවේ භූ විෂමතා සිතියම
4. ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්ති සිතියම (..................)

36. ශ්‍රී ලංකාවේ 1:50000 පරිමාණයේ සිතියමක $4km^2$ ක කුඹුරු යායක් සිතියමේ දැක්වෙන්නේ කුමන පරිමාණයකින්ද?
1. $12cm^2$ කිනි.
2. $8cm^2$ කිනි.
3. $16cm^2$ කිනි.
4. $4cm^2$ කිනි. (..................)

- පහත **A B C** හා **D** වලින් දක්වා ඇති එකිනෙකාට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A
1. පරිසර දූෂණය
2. කාර්මීකරණය

B
1. සාක්ෂරතාවය
2. සංවර්ධනය

C
1. වගාබිම්
2. වන ගහනය

D
1. දේශගුණ වෙනස්වීම්
2. පුනර්ජන බලශක්තිය

37. පළමුවැනි සාධකය දෙවැනි සාධකයේ වැඩිවීමට හේතුවන බව දැක්වෙන මාතෘකා යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

38. දෙවැන්න, පළමුවැන්නේ අයහපතට හේතුවන බව දැක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

39. පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නෙහි අඩුවීමට හේතුවන බව දැක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

40. දෙවැන්න, පළමුවැන්නට යහපත් ආකාරයට බලපාන බවට හේතුවන බව දැක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

* * * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 22 S II

නම: ..........................................

භූගෝල විද්‍යාව - II | කාලය පැය දෙකයි

- මෙම ප්‍රශ්න පත්‍රය I II වශයෙන් කොටස් දෙකකි.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) ( ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

## I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

I. අංක 01 න් දැක්වෙන භෞතික ලක්ෂණය කුමක්ද? (ල:01)
(තුඩුව/ බොක්ක/ /වැලිපරය)

II. අංක 02න් දැක්වෙන ජලවහන ලක්ෂණය කුමක්ද? (ල:01)
(ගංදගරය/ ගංමෝය/ හැඩපලු ගංගාව)

III. අංක 03 දැක්වෙන සංස්කෘතික ලක්ෂණය කුමක්ද? (ල:01)
(තැපැල් කාර්යාලය/ මුස්ලිම් පල්ලිය/ විශේෂ ගොඩනැගිල්ල)

IV. අංක 04 න් දැක්වෙන භෝග වගාව වන්නේ කුමක්ද? (ල:01)
(ගෙවතු/ වී/ වෙනත් වැවිලි)

V. **සිතියම් ප්‍රදේශය පිළිබඳව ප්‍රකාශ තුනක් පහත දැක්වේ. එම එක් එක් ප්‍රකාශ කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්නද වැරදි නම් 'වැ' යන්නද පිළිතුරු පත්‍රයේ ඊට හිමි අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.** (ල:03)

(a) A චතුරස්‍රය තුළ දැක්වෙන්නේ මෙට්‍රික් ඛණ්ඩාංක ඡේදනය වන ස්ථානයකි. (නි/වැ)
(b) පොල්වත්ත ගංගාව ඔස්සේ පළාත් මායිමක් විහිදී ඇත. (නි/වැ)
(c) සිතියම් ප්‍රදේශයේ තේ, රබර් හා පොල් යන වගාවන් සියල්ලම ඇත. (නි/වැ)

VI. B චතුරස්‍රය තුල ඇති ජනාවාස රටාව කුමක්දැයි ලියන්න. (ල:01)

VII. C අක්ෂරයේ දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන සංස්කෘතික ලක්ෂණ දෙකක් ලියන්න. (ල:02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.


| | | |
|---|---|---|
| i. | කැනරි දූපත් | LMN |
| ii. | මලයාසියානු අර්ධද්වීපය | ABC |
| iii. | ඔකොට්ස් මුහුද | PQR |
| iv. | මැකැන්සි ගඟ | HJK |
| v. | ෆින්ලන්තය | STV |

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරිපත් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබද ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

| | | |
|---|---|---|
| i. | පාසිකුඩා වෙරළ | WXY |
| ii. | සොලොන්ගහ පහල | PQR |
| iii. | මහ ඉලුප්පල්ලම | HIJ |
| iv. | මීගමුව | STU |
| v. | ගන්නෝරුව | EFG |

## II කොටස

02\. I. පහත රූප සටහනේ A හා B වලින් දැක්වෙන ස්තර දෙක නම් කරන්න. (ල:02)





II. (a) A හා B ස්තර වෙන්කරන සීමාව හඳුන්වන නම ලියන්න.
(b) B ස්තරය සමන්විත වන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල:03)

III. (a) රූප සටහනේ C ස්තරය බෙදන කොටස් දෙක දක්වා ඒවා හි විශේෂ ලක්ෂණ එක බැගින් ලියන්න.
(b) A ස්තරය විනාශ වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:05)


03\. I. ජල චක්‍රය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල:02)

II. පහත රූප සටහනේ ජල චක්‍රයේ අවස්ථාවන් කිහිපයක් දැක්වේ. එහි A B හා C යන අවස්ථා නම් කරන්න. (ල:03)




III. (a) මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල චක්‍රයේ ගුණාත්මකභාවය අඩු වී ඇත. ඊට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.
(b) ජල සංරක්ෂණය සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඉන් එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ල:05)

- 04 සහ 05 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ලෝක සිතියම භාවිතයට ගන්න.



04. I. සිතියමේ A හා B අක්ෂරවලින් දැක්වෙන නැව් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන රටවල් දෙක නම් කරන්න. (ල:02)

II. ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති බලශක්තිය ආශ්‍රිත ගැටළු 3ක් ලියන්න. (ල:03)

III. (a) ලෝකයේ නැව් තැනීමේ කර්මාන්තය මුල් කාලීනව සංවර්ධිත රටවලට පමණක් යොමු විය. ඊට බල පෑ සාධක දෙකක් ලියන්න.

(b) වර්තමානය වන විට නැගෙනහිර ආසියාතික රටවල් නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්ව තිබේ. මේ සඳහා බලපා ඇති හේතු දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල:05)

05. I. කෘෂි කාර්මික භූමි පරිභෝග ක්‍රම යටතේ

(a) ලෝකයේ වැඩියෙන්ම වගා කරන ව්‍යාපාරික ධාන්‍ය වර්ගයද


(b) ආසියාතික රටවල ශ්‍රම සූක්ෂම වගාවන් ලෙස කෙරෙන ප්‍රධාන ධාන්‍ය වර්ගයද පිළිවෙලින් නම් කරන්න. (ල:02)

II. ඔබ ඉහත I (a) යටතේ සඳහන් කළ ධාන්‍ය වර්ගයේ විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල:03)

III. (a) ඉහත සිතියමේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සඳහා වැදගත් වන රටවල් දෙකක් වන නවසීලන්තය හා ඩෙන්මාර්කය දැක්වෙන අක්ෂර දෙක පිළිවෙලින් ලියන්න.

(b) කිරිපට්ටි පාලනය එම රටවල දියුණුවීම කෙරෙහි බලපෑ සාධක තුනක් ලියන්න. (ල:05)

- **06 සහ 07 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගන්න.**




06. I. ශ්‍රී ලංකාවේ මැදරට තේ වගා කරන දිස්ත්‍රික්ක දෙකක් A හා B අක්ෂර වලින් දැක්වේ. එම දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් නම් කරන්න. (ල:02)

II. (a) ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතන පිහිටි ස්ථානය C අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න.

(b) තේ වගාවේ දියුණුවට හේතුවන භෞතික සාධක දෙකක් ලියන්න. (ල:03)

III. (a) තේ වගාවේ නිෂ්පාදනය ආශ්‍රයෙන් පැන නැගී ඇති ගැටළු 2ක් ලියන්න.

(b) තේ වගාව දියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:05)

07. I. ශ්‍රී ලංකාවේ සංචාරක කලාප දෙකක් E සහ F යන අක්ෂර වලින් දැක්වේ. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ල:02)

II. සංචාරක කර්මාන්තය ආශ්‍රිත මෑත කාලීන ප්‍රවණතා තුනක් ලියන්න. (ල:03)

III. (a) සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

(b) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති සමාජ හා සංස්කෘතික ගැටළු 2ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:05)

08. I. ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්ත කිහිපයක් පහත වරහන තුළ සඳහන් වේ.
(මිනිරන්, ටයර් ටියුබ්, මැණික්, සහල් පිටි)
ඉහත කර්මාන්ත අතරින්
(a) ඛනිජ පාදක කරගත් කර්මාන්ත එකක්ද,
(b) කෘෂිබෝග පාදක කරගත් කර්මාන්ත එකක්ද, නම් කරන්න. (ල:02)

II. ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තයේ නව ප්‍රවණතා 3ක් ලියන්න. (ල:03)

III. (a) පහත සඳහන් ප්‍රදේශවල පිහිටි සාම්ප්‍රදායික ගෘහස්ත කර්මාන්ත මොනවාදැයි පිළිවෙලින් ලියන්න.
1. අම්බලන්තොට
2. පිළිමතලාව

(b) ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිත කර්මාන්ත වර්තමානයේ මුහුණ දීඇති ගැටළු දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:05)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 61 S II |
|---|---|---|

## භූගෝල විද්‍යාව II - Geography II - புவியியல்

**Name / Index number :** ............................................................

01. (අ/A/அ)

| Official Use Only |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| 10 |

(i) .........................................................................................

(ii) .........................................................................................

(iii) .........................................................................................

(iv) .........................................................................................

(v) a) ..................................


b) ..................................

c) ..................................

(vi) .........................................................................................


(vii) .........................................................................................

(ආ) /(ஆ)/ (b)




| | |
|---|---|
| (I) | |
| (II) | |
| (III) | |
| (IV) | |
| (V) | |
| | 05 |

(ඉ) /(இ)/(e)




| | |
|---|---|
| (I) | |
| (II) | |
| (III) | |
| (IV) | |
| (V) | |
| | 05 |

1. (අ) (அ) (a) $\overline{10}$ (ආ) (ஆ) (b) $\overline{5}$ (ඉ) (இ) (c) $\overline{5}$ = $\overline{20}$

(11) WWW.PastPapers.WiKi (10)



Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| | |
|---|---|
| **10** ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)<br>ஆண்டிறுதி பரீட்சை - 2023(2024)<br>**Year End Term Test 2023(2024)** |

භූගෝල විද්‍යාව II - **புவியியல் - Geography II**

Name / Index number : ............................................................




SRI LANKA 1:50,000 SHEET No.91 - MATARA (PART OF)

(11) www.PastPapers.WiKi (11)
Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**